# 31

# ඉස්ලාමීය සන්නිවේදන මාධ්‍ය

وَأَنْذِرْ عَشِيْرَتَكَ الْأَقْرَبِيْنَ

**"තව ද නුඹේ කිට්ටු ඥාතීන්ට අනතුරු අඟවනු" (26 අෂ් ෂුඅරා : 214)**

වත්මන් ලොව තුළ සන්නිවේදන මාධ්‍ය ඉතා ප්‍රබල හා ප්‍රකට බව අවිවාදිත කරුණකි. ඒවායේ විප්ලවීය වෙනස්කම් ඇගයීමට ලක් කළ නොහැක. ඒවා අද අනුමැතිය නොමැති ව නිවෙස් තුළට පිවිසීමට ද පෙර දැනුම්දීමක් නොමැති ව දෙසවනට ළඟා වන්නට ද තරම් බලවත් ය. දැනුම්වත් කිරීම, හැඟීම් ඇවිස්සීමට අදළ ප්‍රබල භූමිකාවක් එයට ඇත. එපමණක් නොව දිනෙන් දින නව්‍යකරණය වේ. මාධ්‍යයේ දයකත්වය නිසා පුවත් විකාශන සන්නිවේදන මගින් ව්‍යාපාර අධ්‍යයනය, රසාස්වාදය, පාරිභෝගිකරණය යනාදි සියලු ක්ෂේත්‍රවල දියුණුව හා වෙනස ඇති කරයි.

මිනිසාගේ සන්නිවේදන වුවමනා ඉටු කිරීමට මාධ්‍යය හඳුන්වා දී ඇත. ආරම්භයේ දී මිනිසා ඔවුන්ගේ අදහස තවත් කෙනෙකුට ක්‍රියාව, සංඥාව, සලකුණ, මුහුණු සලකුණ, සලකුණු, කථනය, ලිවීම වැනි මාදිලි භාවිතයෙන් ලබා දී ඇත. ඒවායේ දියුණුව නිසා අද විවිධ ආකාරයේ මාධ්‍යය ඇති වී ඇත. මුද්‍රණ මාධ්‍ය, ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය, සමාජ මාධ්‍ය ජාල යන ඒවා කොටස් කර බලති. එම නිසා සන්නිවේදනය ගැන ඉස්ලාමයේ දැක්ම පැහැදිලි කිරීම අවශ්‍ය ය.





ඉස්ලමයේ මූලික මූලධර්මයක් වන අලකුර්ආනය, සුන්නාව යන දෙක ම ඉතා පැරැණි මාධ්‍යය වේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල් කුර්ආනය තමාගේ ප්‍රධාන මාධ්‍යයක් ලෙස හා ආයුධයක් ලෙස භාවිත කළ හ. මේ වගේ කළ යුතු යැයි අල්ලාහු තආලා අණ කර ඇත.

නබිවරයාණෙනි, නුඹ ඒවා (අල්කුර්ආනය) මාධ්‍යයක් ලෙස භාවිතා කර ඔවුන්ට එරෙහි ව තර්ක කරනු (25ෆුර්කාන් : 52)

එම නිසා අල් කුර්ආනය අද්විතීය සාහිත්‍යමය මාධ්‍යයකි. මහා කවියෝ සාහිත්‍යකරු ද එහි භාෂා ශෛලිය ඉදිරියේ ගොළු වූහ. එහි ආකර්ෂණීය බව නිසා බන්ධනයකට ලක් වූවන් ලෙස තුෂ්නිම්භූත වූහ. ආත්මය අවදි කරවන එහි බලය දැක සතුරෝ, මෙම මාධ්‍යයට විරුද්ධ මත ගැටුමක් ඉතිහාසය තුළ ඇති කළහ."මෙම කුර්ආනයට නුඹලා සැලකිල්ල යොමු නොකොට අනෙක් කරුණු ගැන සැලකිල්ලෙන් සිටිය යුතු යැයි කාෆිර්වරු ප්‍රචාරය කළෝ ය. නළීර් ඉබ්නු හාරිද් නැමැත්තා ගායිකාවක මිලට ගත්තේ ය. ඉස්ලාමය වැළඳ ගැනීමට කැමැත්ත එල කරන්නන් සොයා ඔවුන් එම ගායිකාව ළඟට කැඳවාගෙන ගොස් "ස්ත්‍රිය මොවුන්ට කෑම දෙන්න, වතුර දෙන්න, ගී ගයන්න යනුවෙන් පවසා මිනිසා! මුහම්මද් ඔබලාව, සලාතය, සව්මය වීර මරණය ගැටුම යනාදියට සහභාගිවීමට කැඳවයි. ඒවාට වඩා මෙය ඔබලාට හොඳයිනේ, යන්නෙන් පැවසී ය.

මෙම තත්ත්වය තුළ "මිනිසාගෙන් බොහෝ දෙනා සිටියි. ඔවුන් (ව්‍යාජ කථන්දර වැනි) වුවමනා නොමැති කරුණුවලට (ඒවා ජනතාවට පරායනය කර පෙන්වා) අල්ලාහ්ගේ මාර්ගයෙන් සිට කිසි ම දැනුමක් නොමැති ව ජනතාව නොමග යවා ඒවා සහැල්ලුවට ලක් කරති." (31 ලුක්මාන් :6) යන වැකිය පහළ විය.

නමුත් මෙවන් පටුමාර්ග යොදා ජනතාව ඉස්ලාමයේ මග පෙන්වීමෙන් බැහැර කිරීමට තැත් කළ අවස්ථාවේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉවත බලා සිටියේ නැත. එතුමා ද ක්ෂේත්‍රයට පිවිසියේ ය. එවකට තබූ සියලු මාධ්‍යයන් භාවිත කර අසත්‍යයේ ව්‍යාජත්වය හෙළි කළ අතර ඉස්ලාමයේ වැදගත්කම පහදා දුන්නේ ය. කාෆිර්වරු තවත් හැල්ලුවට ලක් කරන කවි කීවෝ ය. ඉස්ලාමයට අපකීර්තිය ඇති කිරීමට තැත් කරන වකවානුව තුළ හස්සාන් ඉබ්නු සාබිත්, කඃබු ඉබුනු මාලික්, අබ්දුල්ලාහ් ඉබුනු රබාහා වැනි සහාබාවරුන් කැඳවා කාෆිර්වරුන්ට විරුද්ධ ව කවි කියන ලෙස බල කර දිරිමත් කළේ ය.

"නබිවරයාණෙනි, ඔබේ ඉතා කිට්ටු ම ඥාතීන්ට ද අවවාද කරන්න." (26 අෂ් ෂුඅරා :214)



යන අල්කුර්ආන් වැකි පහළ වූ විට සෆා කන්දට නැග එහි සිට තමන්ගේ පවුල් ඥාතීන් වන කුරෛෂිවරුන්ට ශබ්ද නගා ආරාධනා කර ඉස්ලාමය හඳුන්වා දුන්නේ ය. ජාහිලියියා කාල සිරිත නම් වැදගත් ප්‍රවෘත්තියක් කීමට උස ම ස්ථානයකට නැග ඇඳුම් ගලවා එම ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමයි. එම සිරිතම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ද අනුගමනය කළේ ය. නමුත් එතුමා ඇඳුම් ගැලෙව්වේ නැත. ගරුත්වයෙන් කටයුතු කළේ ය. මෙම සිදුවීම අන් අය ඇති කළ මාධ්‍ය උපක්‍රම ෂරීඅත් සීමාව තුළ සිට මුස්ලිමෙකු හට භාවිතා කිරීමට හැකි ය, යන බව උගන්වයි. වත්මන් නවීන මාධ්‍යයන් මෙම දක්මෙන් කටයුතු කළ යුතු ය. සෆා කන්ද පමණක් නොව, ඔටුවාගේ පිට, උක්කාල්, විජන්නාහ්, දුල්මජායි වැනි පොළවල් මස්ජිද් , මිම්බරය, මෘදනා යනාදිය ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් මාධ්‍යයක් ලෙස භාවිත කර ඇත.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තමන්ගේ සහාවරුන්ගේ ශුභසිද්ධිය තකා තමන්ගේ අදහස් ඉතා සරල ව පැහැදිලි ව වටහා ගැනීමට විවිධ වෙනස් මාධ්‍යයන් භාවිත කළේ ය. එක්අවස්ථාවක තමන්ගේ අතින් ම පොළොවේ ඉරක් ඇන්දේ ය. පසු ව මෙය අල්ලාහ්ගේ ඍජු මාර්ගය කියා පැවසුවේ ය. එසේ පවසා දකුණේ සමහර ඉරි ඇන්දේ ය. මෙම සෑම ඉරකින් ම ෂෙයිතාන් සිටගෙන ආරාධනා කරන බව පවසා "මෙය මගේ ඍජු මාර්ගය එය අනුගමනය කරන්න, අනෙකුත් මාර්ග අනුගමනය නොකරන්න. (6 අල් අන්ආම් :153) යන අල්කුර්ආන් වැකිය පාරායනා කළේ ය.

තවත් අවස්ථාවක නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙළෙඳ පොළේ පයින් ගමන් කළේ. ය. ජනතාව එහි දෙපැත්තෙන් ම සිටිති. ඒ අවස්ථාවේ දී කන කැපූ එළු ඔළුවක් දැක එය අතට ගෙන ඔහු මෙය එක් දිර්හමයට ලබා ගැනීමට කැමති ද යන්නෙන් විමසී ය. මෙය මිලට ගෙන කුමන ඵලයක් ද? අපි එය මිලට නොගන්නෙමු, නමුත් පණ පිටින් සිටි නමුදු කන කපා ඇති නිසා එයට අපි කැමැති නොවෙමු, යන්නෙන් සහබාවරු පිළිතුරු දුන්හ. ඒ අවස්ථාවේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් "මෙම භාණ්ඩය නුඹලාට කොයිතරම් බාල එකක් ලෙස පෙනෙවීදෝ එයටත් වඩා මෙලොව අල්ලාහ්ට බාල එකකි." (මුස්ලිම්) යන්නෙන් පැවසී ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්තුමාණන් "මාත්, අසරණයා පරිපාලනය කරන්නාත් ස්වර්ගයේ මේ වගේ සිටින්නෙමු," යන්නෙන් තමාගේ මැදඟිල්ල දඹරගිල්ල එකට එකතු කර පෙන්වා දුන්හ. (බුහාරි)

ජුම් ආ ඊද් උත්සවවල කුත්බා දේශනාවන්, ග්‍රහණ සලාතය, වැසි ඉල්ලා වඳින සලාතය යනාදිය පවත්වන කුත්බා දේශනයන්, හජ්ජි අරෆාවේ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මාධ්‍යයක් ලෙස භාවිත කර තමන්ගේ අදහස් ඉදිරිපත් කළේ ය. මස්ජිදුන් නබවියේ පැත්තක පිහිටි ස්ථානය "අස්හාබුස් සුප්පාවරුන්ගේ මාධ්‍යය මධ්‍යස්ථානය වේ. හල්කා යන අධ්‍යාපන කවය ලෙස ද එය භාවිත කරන ලදි. ජමාඅත් සලාතයට ජනතාව අවදි කරවන පණිවුඩ ලෙසින් කැඳවන තක්බීර් ශබ්දය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ගත් මාධ්‍ය උපක්‍රමයට තව ද උදාහරණයකි.

සංවෘත සන්නිවේදන මාධ්‍ය ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ලිපි හා දූත මෙහෙවරයන් භාවිත කළේ ය. එම අවස්ථාවේ දී ම දිවානුල් ඉන්ෂා යන ලියාපදිංචි තැපැල් දෙපාර්තමේන්තුව ද ඇති කළේ ය. තමන්ගේ දූත මෙහෙවර ගෙනයාමට ලිඛිත මාධ්‍ය ක්‍රියාත්මක කිරීමට එහි විශේෂ දූතයන් ද ලේඛකයන් ද පත් කළේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් තමන්ගේ මක්කම ජීවිතයේ නුබූව්වත් 5 දී අබිසීනියාවට ජඃෆාර් ඉබ්නු අබූතාලිබ් රහ්මතුල්ලාහ් තුමාගේ නායකත්වයෙන් දූත පිරිසක් යැව්වේ ය. මදීනාවට මුසාබ් ඉබ්නු උමෛර් රළියල්ලාහු අන්හු තුමා තමා නියෝජිතයකු හැටියට යැව්වේ ය. මදීනා ජීවිතයේ යේමනයට මුආද් ඉබුණු ජබල් රළියල්ලාහු අන්හු තුමාව ද නියෝජිතයකු හැටියට යැව්වේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මුද්‍රා තැබූ ලියුම්, සහබාරුන් බොහෝ දෙනා අසල්වැසි රාජ්‍ය පාලනය කළ රජවරුන්ට හා අග්‍රාණ්ඩුකාරවරුන්ට රැගෙන යන ලදි. අබිසීනියියා පාලනය කළ නජ්ජාසි රජුට අම්ර් ඉබ්නු උමෛයා රළියල්ලාහු අන්හා තුමා ද ඊජිප්තුවේ රජ මුකවාකිස් හට හාතිබ් ඉබ්නු අබූ බල්දආ රළියල්ලාහු අන්හු තුමා ද පර්සියාවේ රජ කිස්රා වෙත අබ්දුල්ලාහ් ඉබ්නු හුතාමා රළියල්ලාහු අන්හු තුමා ද රෝම රටේ රජ හර්කියුලස්ට නිහියා ඉබුණු කල්බ් රළියල්ලාහු අන්හු තුමා ද යමාමා රටේ රජ සව්ද ඉබුණු අලී වෙත, සලීද් ඉබුණු අබූ අල් ආම්ර් රළියල්ලාහු අන්හු තුමා ද සිරියා රජු හාරිල් ඉබුණු අබූ හමීර් වෙත ෂුජා ඉබ්නු වහබ් රළියල්ලාහු අන්හු තුමා ද ඕමානය රටෙහි රජ සෘෆර් වෙත අම්ර් ඉබුනු ආස් රළියල්ලාහු අන්හු තුමා ද ලියුම් ගෙන යන ලදි.

මෙසේ යවන ලද ලිපි පදනම් කරගෙන උමර් රළියල්ලාහු අන්හු තුමා දිවානුල් බරීද් නම් තැපැල් දෙපාර්තමේන්තුව ඇති කළේ ය. මෙය උමෛය්යාවරුන්ගේ වකවානුවෙහි දීවානුල් බරීද්වල් අක්බර් යන නාමයෙන් තැපැල් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවක් ලෙසට දියුණු විය. ඒ අවස්ථාවේ පරෙවියන් තැපැල් වාහන යනාදිය භාවිත කළේ ය. මේ හැර මෙම සන්නිවේදන ක්‍රියාවලිය දීවානුල් රසායිල්, දිවානුල් කාතිබ්, දිවානුල් තාහිබ් යන දෙපාර්තමේන්තුන් ලෙස ක්‍රියා කළ හැටි දැකිය හැකි ය.

මුස්ලිමෙකු තොරතුරුවලින් පැහැදිලි ව හා සියුම් ලෙස සිටිය යුතු යි. තොරතුරු දැන ගැනීම අත්‍යවශ්‍ය වේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මදීනාවට හිජ්රතයේ දී තව්ර් ගුහාවේ තෙදිනක් නතර වුණේ ය. මක්කමේ විසූ කුරෛෂිවරුන්ගේ ක්‍රියා කලාපය රහසෙන් දැන ගැනීමට අබ්දුල්ලාහ් ඉබ්නු අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා පත් කළේ ය. මුෂ්රික්වරුන්ගේ ක්‍රියාදමය දැනගැනීමට ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු

තුමා හට පරක්කු වී පැමිණෙන ලෙස ලිපියක් ලිව්වේ ය. විරුද්ධවාදීන්ගේ සේනාවේ පැමිණීම ගැන දැන ගැනීමට ඔටුවන්ගේ මල පරීක්ෂාවට ලක් කළේ ය. ගුහාවක් තුළ සිටි නමුදු තමා අවට සිදුවන දේ ගැන අවදියෙන් සිටිය යුතු යි. එවැනි නොපෙනෙන ස්ථානයක සිට වුව ද මාධ්‍ය උපක්‍රම භාවිත කර තොරතුරු දැන ගත යුතු යි, යන්නෙන් මෙය විදහා දක්වයි.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්තුමාණන් තමා අවට පිහිටා තිබූ දුර රටවල පවතින තත්වය ගැන හොඳ අවදියෙන් සිටියේ ය. අබිසීනියා රජ කව්ද, ඔහුගේ ආශාව කුමක් ද, ඔහුගේ ද එම රටේ ජනතාවගේ ද ගුණාංග මොනවා ද, එම රටේ විදේශ ප්‍රතිපත්තිය කුමක් ද, යනාදිය හොඳට දැන සිටිය නිසා පළමුවෙනි හිජ්රත් කණ්ඩායම එහි යැව්වේ ය. ෂීබා රටේ රැජින බල්කීස්, සුලෙයිමාන් අලෛයිහ්ස්සලාම් යනාදි අයවරුන් දුරබැහැර රටවල්වල ප්‍රවෘත්ති දැන ගැනීමට හුද්හුද් කුරුල්ලාව භාවිත කරන ලද පුවත අල් කුර්ආනය පවසයි. මෙය ද අවට සිදු වන දේ ගැන අවදියෙන් සිටීම අත්‍යවශ්‍ය ය, යන්න සාක්කි වේ. ඉහත පවසන ලද විවිධ උපක්‍රම අවස්ථානුකූල ව වුවමනාවන්ට අනුව පසුතලයේ විවිධ සංවිධානවල අනුගමනය කර ඇත.

වත්මන් සන්නිවේදන මාධ්‍යයේ දියුණුව අනුව ජාත්‍යන්තර තලයට අදහස් උදහස් සබධතා ඇඟිලි තුඩින් පවත්වාගෙන යයි. බලසම්පන්න රාජ්‍යයන්ගේ නාවික හමුදව, ගුවන් හමුදව, හමුදව, ශක්තිය හා බලය යනාදිය සන්නිවේදන මාධ්‍යයන් මඟින් අභිභවා ගොස් ඇත. ඒවා රටක ජය හා පරාජය තීරණය කරන සාධක බවට පත් වි ඇත. එය ලබා දෙන යහපත් දේ බොහෝ ය. අයහපත් දේ ද බොහෝ ය. මිනිසාගේ පාරම්පරික සමාජය, ආශාව, සංස්කෘතිය යනාදියට වෙනස් ව ඔහුන්ට ආමන්ත්‍රණයට ලක් කරයි. එහි අයහපත් දේ පාලනය කළ නොහැක. අපරාධ ක්‍රියාවල ප්‍රවණතාවන් ද දැනුමට මග පාදයි. වැඩිහිටියන් හා තරුණයන් යන සීමාව ඉක්මවා ඇවිදින දරුවන්ව ද ආක්‍රමණය කර ඇත. එම නිසා සන්නිවේදන මාධ්‍යය විධිමත් ව භාවිත කළා නම් එය අපට ලබා දෙන යහපත් දේ අපරිමිත ය. එම නිසා ඒ ගැන ඉස්ලාමීය දෘෂ්ටිය දැනගෙන භාවිත කළ යුතු යි.

මූලික ව සියලු අංගයන් අනුමත කර ඇත, යන නීතියට යටත් ව එක් එක් කාලවකවානුවල භාවිත වන සොයා ගැනීම තොරතුරු තාක්ෂණ මාධ්‍යය උපක්‍රම හොඳ අදහස් ව්‍යාප්ත කිරීමට හොඳ අදහස් ලබා දීමට ද සමාජයේ ගතිගුණාංග වර්ධනය වීමට ද අධ්‍යාත්මික ප්‍රවණතා ශක්තිමත්වීම ද විනය හා සාරධර්ම ආරක්ෂා කිරිමට ද ඉස්ලාමය අනුමැතිය දී ඇත. ඒ සමග මාධ්‍යයන් කුමන සංස්කෘතික ගති පැවතුම් තිබිය යුතු ද යන්නෙන් ද පැහැදිලිව කියා ඇත. ඒවා පහත සඳහන් අන්දමින් වෙන් කර පැහැදිලි කළ හැකි ය.

### 1. තහවුරු වි තිබීම (සහතික වීම)

සන්නිවේදන මාධ්‍යයන් නිකුත් කරන තොරතුරු සහතික කළ යුතු යි. තමාට ලැබෙන තොරතුරු සියල්ල ම සහතික නොකර නිකුත් කළ නොහැක. "කෙනෙකු තමන්ට ඇසෙන තොරතුරු සියල්ල ම (සහතික නොකර) නිකුත් කිරීම ඔහු කියන මහා බොරුවෙකි, යන්නෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසී ය. (මුස්ලිම්)

එක් වතාවක නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ළඟට පැමිණි කෙනෙකු බනූ මුත්තලිෆ් ගෝත්‍රිකයන් ආගම් වෙනස් කර ඇති බවට දැන්වූ විට එම ප්‍රවෘත්තිය පදනම් කොට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සමහර ක්‍රියාවලි මෙහෙයවීමට තැත් කළේ ය. එම අවස්ථාවේ දී "විශ්වාසවන්තයෙනි, කුමන සතුරෙකු ඔබ ළඟට කුමක් හෝ ප්‍රවෘත්තියක් ගෙනා විට (එහි සත්‍යතාව දැන ගැනීමට ඒවා) හොඳට තහවුරු කර පැහැදිලි කර ගන්න. නැතහොත් ඔහුගේ කියමන විශ්වාස කර නොදැනීම නිසා සමාජයට හානි කරන අන්දමට තීරණයන්ට එළඹිය හැකි ය. පසු ව කළ දේ ගැන නුඹලාට දුක් වීමට හෝ ශෝකයට පත් වීට සිදු වනු ඇත. (49 අල් හුජ්රාත් : 6) යන අල්කුර්ආන් වැකිය අල්ලාහ් විසින් පළ කරන ලදි.

එමනිසා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්තුමාණන් මෙම තොරතුරු සහතික කිරීමට කාලිද් ඉබුණු වලීද් රලියල්ලාහු අන්හු තුමා යැව්වේ ය. ඔහු තමාගේ රහස් තොරතුරු සොයන්නට රාත්‍රී කාලයේ යවා බනූ මුස්තතලක් ගෝත්‍රිකයන් අධීක්ෂණයට ලක් කළේ ය. ඒ අවස්ථාවේ දී ආගම් මාරු නොවී ඇති බව තහවුරු වූ ප්‍රවෘත්තිය එතුමාට ලැබුණේ ය. එම නිසා මාධ්‍යයන් ප්‍රකාශයට පත් කරන වාර්තා දත්ත සියල්ල ම සහතික කිරීමෙන් පසු ව නිකුත් කළ යුතු යි. "නුඹලා ඇත්ත ප්‍රකාශ කරන්නන් බවට ඔබ සිටී නම් ඔබේ සාක්කි ගේන්න. (27 අන් නම්ලු : 64) යන්නෙන් අල්කුර්ආනය පවසයි.

## 2. විශ්වාසවන්ත භාවය

සත්‍යය හා ආරක්ෂාව මාධ්‍යකරුවකුට තිබිය යුතු වැදගත් ගුණාංග වේ. (මූලික වශයෙන්) මූලික ධර්මයෙන් තොරතුරු ලබාගත් අවස්ථාවේ දී එය නිවැරදි ද යන්නෙන් විශ්වාසය හා ආරක්ෂාව රැකිය යුතු යි. මනඃකල්පිත ආඩම්බරය, අතිශයෝක්කිය, බොරු මිශ්‍රණය, යනාදිය බැහැර කර විශ්වාසවන්තභාවයෙන් යුක්ත ප්‍රවෘත්ති පමණක් ප්‍රකාශ කළ යුතු යි. "නුඹලා ඇත්ත ප්‍රකාශ කරන්නන් හැටියට මාහට සාක්කි දැනුම් දෙන්න (6 අල් අන්ආම් අන් නිසා :143) යන්නෙන් අල්කුර්ආනය පවසයි.

## 3. මධ්‍යස්ථභාවය හා නිරවද්‍යතාව

ධාර්මික වගකීම් සහිත මාධ්‍ය කිසිසේත් ම පක්ෂග්‍රාහී නොවිය යුතු ය. ප්‍රවෘත්තිය විකෘති කර ද අභිභවා ද අඩු තක්සේරු කර ද නිකුත් කිරීම සාරධර්මයට පටහැනි ය. විශ්වාසවන්තයෙනි, නුඹලා සාධාරණත්වයේ පවතින්න. (නුඹලා සාක්කි කිවා නම් එය) නුඹලාට හෝ නුඹලාගේ දෙමව්පියන්ට ද හෝ කිට්ටු ම ඥාතීන්ට එරෙහි වන අන්දමට තිබුණ ද අල්ලාහ්ට (අමනාප) සාක්කි දරන්නා හැටියට පත්වන්න. (නුඹලා කාහට සාක්කි කියන්නේ ද?) ඔහු ධනවතෙක් ද, දුප්පතෙක් ද (සත්‍ය ව ප්‍රකාශ කරන්න එම නිසා) අල්ලාහ්ගේ එම දෙදෙනාට ම (උදව් කරන්න) ඉතා සුදුසුවන්තයා වේ. එම නිසා නුඹ (නුඹේ) ආශාවන් ද (අභිලාෂයෙන්) අනුගමනය කර සීමාව නොඉක්මවන්න (4 අන් නිසා :135)

## 4. ශුභසිද්ධිය රැකීම

සෑම පුද්ගලයකුට ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසක් ඇත.මාධ්‍යවලට ද මේ නිදහස ඇත. නමුත් මෙම අයිතිවාසිකම භාවිත කරන විට පොදු ජනතාවගේ ශුභසිද්ධියට හානි නොවන බවට වග බලාගත යුතු ය. වැරදි ක්‍රියාවලට යොමුවන යම් දෙයක් විකාශනය කිරීම, දර්ශනය කිරීම, නිකුත් කිරීම යනාදිය, සීමාව ඉක්මවා යෑමකි; ද්‍රෝහිවීමකි. නමුත් අපරාධ ක්‍රියාවන් තව තවත් වර්ධනය නොවීමට වග බලා ගත යුතු යි. සාරධර්මයෙන් යුක්ත ව ජීවත්වීමට මග පාදා ගත යුතු යි. සමාජයේ ඇති වීගෙන යන ලිංගික අතවර හා දූෂණය සීමාව ඉක්මවා යෑම නිසා ද ප්‍රසිද්ධ කිරීම නිසා ද දුබලයන් ඒ තුළ වැටීමට ද දිරිගැන්වීමට ද මග පෑදිය හැක. එම නිසා මේ වගේ නීච සිද්ධීන් හා ප්‍රවෘත්ති ප්‍රකාශ කරන්නන්ට අල්ලාහ් දැඩි ලෙස අවවාද කරයි. "විශ්වාසකයින් අතර දුරාචාරය පහළවීම ප්‍රිය කරන අයට නියත වශයෙන් ම මෙලොවත් පරලොවත් වේදනීය දඬුවම් ඇත. අල්ලාහ් දන්නෙහි ය; නුඹල නොදන්නෙහු ය." (24 අන් නූර් :19)

## 5. සදාචාරය රැකීම

ඕනෑම තොරතුරක් නිවැරදි සදාචාර කමින් ඉදිරිපත් කළ යුතු යි. නීච හැඟීම් දිරි නොවී විරෝධතාව හා සතුරුකම වර්ධනය නොවන ශිෂ්ට වචන භාවිත කළ යුතු යි. " අපරාධය කරන ලැබූ අයට හැර අන් කිසිවෙකුට පරුෂ වචන ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම අල්ලාහ් ප්‍රිය නොකරයි. අල්ලාහ් සරවශ්‍රාව්‍යය, සරවඥණිය." (4 අන් නිසා :148)

"තව ද ඔවුන් සමග ඉතා හොඳින් කරුණු සාකච්ඡා කරන්න." (16 අන් නහ්ල් :125)

නිදහස් සන්නිවේදන ක්ෂේත්‍රය ද මුළු මිනිස් සංහතියට ම ශුභසිද්ධිය අරමුණු කොට නීතිය මිනිස් අයිතිවාසිකම් යනාදිය තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම සහ සහාය ලබාදෙන අතර තනි පුද්ගල, පවුල්, ජාතික මට්ටමින්, ජාත්‍යන්තර මට්ටමින් විනය සදාචාරය රැකීමට ද, එකමුතුකම රැකීමට ද, හොඳ අනාගතයක් තහවුරු කිරීමට ද මග පෙන්වීමට අවශ්‍යය බව ඉස්ලාම් බලාපොරොත්තු වේ.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

❁ الجُمْعَةُ ❁ العِيْدُ ❁ المَسْجِدُ ❁ عُكَّاظٌ ❁ ذُو المَجَازِ ❁ المِنْبَرُ ❁ المَأْذَنَةُ ❁ الخُطْبَةُ ❁ أَصْحَابُ الصُّفَّةِ ❁ الحَلْقَةُ ❁ دِيْوانُ الإِنْشَاءِ ❁ دِيْوانُ البَرِيْدِ والأَخْبَارِ ❁ دِيْوانُ الرَّسَائِلِ ❁ دِيْوانُ الخَاتَمِ ❁ دِيْوانُ الكَاتِبِ ❁ هُدْهُدْ ❁ بَنُو المُصْطَلَقِ

## අභ්‍යාසය

1. මාධ්‍යයේ වැදගත්කම ගැන විස්තර කරන්න.
2. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාහඳුන්වා දුන් හා ක්‍රියාවට යෙදූ සමහර මාධ්‍ය ක්‍රම ගැන සඳහන් කරන්න.
3. මාධ්‍යයන් අනුගමනය කළ යුතු ගුණාංග ගැන සඳහන් කරන්න.
4. මාධ්‍ය හා විනයේ දී අය ලබා ගන්නා හොඳ නොහොඳ ක්‍රම ගැන සඳහන් කරන්න.